ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 159/1 — 1975 අප්‍රේල් 13 වැනි ඉරිද — 1975.04.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### රේගු දැන්වීම—අංක 73/1/91

1973 ජූනි මස 7 වැනි දින අංක 62/9 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 අංක 19 දරණ ආදයම සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥුව ක්‍රියාත්මක කිරීම සඳහා, 1975 අප්‍රේල් මස 14 වැනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොලෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් රුපියල් 1,794.00 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ ;—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | අමු පොල්ගෙඩි 1,000 ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|---|---|---|
| රු. ශ. | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| 703 98 | ... | 956 99 | ... | 812 92 | ... | 175 79 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

වි. මුතුලිංගම්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක. ඒ. 744/63,
1975 අප්‍රේල් මස 13 වැනි දින,
කොළඹ, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

4—438

---

### රේගු නිවේදනය—අංක 73/2/90

1962 අංක 19 දරණ ආදයම සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තිය යටතේ 1973 ජූලි මස 24 වැනි දින අංක 69/3 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥුව අනුව, 1975 අප්‍රෙල් මස 14 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්.එස්.එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්.ඕ.බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ :—

මෙ තීරු ගාස්තුව—

(i) 1968 මාර්තු මස 15 වැනි දිනැති අංක 14,793 දරණ ගැසට් පත්‍රයේ පලකර ඇති නිවේදනය මගින් රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ පනවා ඇති පරිදි ඕනෑම වර්ගයක රබර් සඳහා රාත්තලකට ශත 03 බැගින් වන සෙස් ගාස්තු ප්‍රමාණයට, හා

(ii) රේගු ආඥාපනත හැර වෙනත් ලිඛිත නීතියක් යටතේ ඕනෑම වර්ගයක රබර් වෙනුවෙන් අයකරගත යුතු හෝ ගෙවිය යුතු අපනයන තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්බර එකේ ආර්.එස්.එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්.ඕ.බී. වටිනාකම රාත්තලකට ... ... | 1 62 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව රාත්තලකට ... ... ... ... | 0 38 |

වි. මුතුලිංගම,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක. ඒ. 744/64.
1975 අප්‍රේල් මස 13 වැනි දින,
කොළඹ, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

4—437

---

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

සැ. යු.—158/1 කොන් බයේ අවසාන අතිවිශේෂ ගැසට් පත්‍ර අංකය 158/11 ය.

264/1——ඒ 13,466—4,325 (75/04)